



නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

CIDA
CONSTRUCTION INDUSTRY
DEVELOPMENT AUTHORITY

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය



OTC

ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල
ගල්කුලම, අනුරාධපුර

2024.03.28

# ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ මෙහෙයුම් ශිල්පී පාඨමාලාව

ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ මෙහෙයුම් ශිල්පීය පුහුණු මිනිස් බල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ලෝක බැංකු ආධාර ඇතිව 1982 වර්ෂයේ දී අනුරාධපුර ගල්කුලමෙහි පිහිටුවන ලද මෙම මෙහෙයුම් ශිල්පීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම ක්ෂේත්‍රයේ පුහුණුව ලබාදෙන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන මේ මගින් වාර්ෂිකව විශාල සංඛ්‍යාවක් පුහුණුව ලබයි.

න්‍යායික පුහුණුව (30%) ලබාදෙන අතරම නිපුණතා සංවර්ධනය සඳහා ප්‍රායෝගික පුහුණුව වැඩි වශයෙන් (70%) ලබාදෙනු ලැබේ.

තෝරා ගන්නා අයදුම්කරුවන්ට පුහුණු මධ්‍යස්ථානයේදී නේවාසික පහසුකම් නොමිලයේ සපයනු ලබයි. ඇඳ ඇතිරිලි ආදිය තමන් විසින් සපයා ගත යුතු අතර ආයතන ආපනශාලාවෙන් පහසු මිලට ආහාර පාන ලබාගත හැකිය.

**අයදුම් කිරීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම්**

අංක 11 සහ 12 පාඨමාලා හැදෑරීමට පමණක් බර වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

1) වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුයි

2) සෑම ආධුනිකයෙක්ම අංක 01, "මූලික ඉදිකිරීම් යන්ත්‍ර නඩත්තු ශිල්පය" හැදෑරිය යුතුය.

3) පාඨමාලාව සඳහා කැඳවීම් කරනු ලබන්නේ අදාළ පාඨමාලාව සඳහා මුදල් ගෙවනු ලබන අනුපිළිවෙලට බව කරුණාවෙන් සලකන්න.

4) අංක 12, යන්ත්‍රෝපකරණ ප්‍රවාහකය පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන්නන්ට ඒ සඳහා අවශ්‍ය මූලික නිපුණතාවය නොමැතිනම්, ඔහු ඊට ප්‍රථමයෙන් අංක 11,"ඩම්ප්ට්‍රක් රථය" හැදෑරිය යුතුය.

5) ඔබගේ අයදුම් පත්‍රයට ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ රියදුරු බල පත්‍රයේ පිටපතක් අමුණා නොමැති අයදුම් පත් භාරගනු නොලැබේ.

6) ජාතික ශිල්පී හැඳුනුම්පත ලබාගැනීම සඳහා ඔබගේ පුහුණු පාඨමාලාවේ දෙවන අධියරේදී පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් සමග රු.790/- රැගෙන ආ යුතුය.

| | පාඨමාලාවේ නම | සංකේත අංකය | කාලය (දින) | පාඨමාලා ගාස්තුව |
|---|---|---|---|---|
| 01 | මූලික ඉදිකිරීම් යන්ත්‍ර නඩත්තු ශිල්පය | BaCEM | 05 | 7,500.00 |
| 02 | සැහැල්ලු ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පය | LEO | 06 | 20,000.00 |
| 03 | ට්‍රැක්ටර් පුහුණු පාඨමාලාව | T | 05 | 25,000.00 |
| 04 | කම්පන රෝලර් පුහුණු පාඨමාලාව | SPVR | 05 | 35,000.00 |
| 05 | ලෝඩර් බැක්හෝ | LB | 10 | 60,000.00 |
| 06 | වීල් ලෝඩරය | WL | 10 | 70,000.00 |
| 07 | එක්ස්කැවේටරය | HE | 15 | 85,000.00 |
| 08 | මෝටර් ග්‍රේඩරය | MG | 15 | 98,000.00 |
| 09 | ඩෝසරය | CT | 15 | 120,000.00 |
| 10 | ජංගම දොඹකරය | MC | 10 | 97,000.00 |
| 11 | ඩම්ප්ට්‍රක් රථය | DT | 10 | 45,000.00 |
| 12 | යන්ත්‍රෝපකරණ ප්‍රවාහකය | PT | 10 | 60,000.00 |
| 13 | ෆෝක්ලිෆ්ට් ට්‍රක් | FLT | 10 | 40,000.00 |
| 14 | ස්කිඩ් ලෝඩරය | SL | 05 | 22,000.00 |
| 15 | බූම්ට්‍රක්/ක්‍රේන්ට්‍රක් | TMC | 05 | 30,000.00 |
| 16 | ඉදිකිරීම් යන්ත්‍ර කළමනාකරණ පාඨමාලාව | PM | අවශ්‍යතාවය අනුව සැලසුම් කළ හැකිය | |

**අයදුම් කිරීම සඳහා**

1) අපගේ අයදුම් පත්‍රය හෝ එහි A4 ප්‍රමාණයේම ඡායා පිටපතක් භාවිතා කරන්න.

2) ඔබට මූලික සුදුසුකම් ඇත්නම් ඔබගේ අදාළ පාඨමාලා ගාස්තුව සහ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ද රැගෙන වැඩ කරන දිනවල පස්වරු 3.00 ට පෙර කොළඹ ප්‍රධාන කාර්යාලයට, ගල්කුලම පුහුණු මධ්‍යස්ථානයට හෝ වීරවිල ශාඛාව වෙත පැමිණ ලියාපදිංචි වන්න.

3) අයදුම්පත් තැපැල් මගින්ද යොමු කළ හැක.

ඔබගේ අයදුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කොට ඕනෑම ලංකා බැංකු ශාඛාවක මුදල් තැන්පත් කරන ලද රිසිට්පත,ජාතික හැඳුනුම්පතෙහි ඡායාපිටපත සහ දුරකථන අංකය සටහන් කොට පහත ලිපිනයට යොමු කරන්න.

පාඨමාලා ගාස්තු ගිණුමට බැර කිරීම සඳහා
ගිණුම් අංකය - 77454994
ගිණුමේ නම - CIDA - CMOTC

**ලිපිනය :-**

ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල,
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය.
ගල්කුලම,
අනුරාධපුරය.

දුරකථන : 025-2050520, 025-2050521,
ෆැක්ස් : 025-2050522
ඊ-මේල් : cidaotc@gmail.com
: cidaotc@sltnet.lk

**ප්‍රධාන කාර්යාලය**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය.
"සව්සිරිපාය",
අංක 123, විජේරාම මාවත,
කොළඹ - 07.

දුරකථන 011-2699801, 011-2686856,
ෆැක්ස් : 011-2699738
ඊ-මේල් : info@cida.gov.lk
Web : www.cida.gov.lk